අරුණ පුවත්පතේ පළවූ ප්‍රවෘත්ති වාර්තාවක සිරස්තලය තුළ "කොවිඩ් සිසුවා" සඳහන් වේ. නමුත් මෙම පුවත් වාර්තාවේ අන්තර්ගතයෙහි සඳහන් වන්නේ "කොවිඩ් වයිරසය ආසාදනය වී සිටින...ශිෂ්‍යයා..." යනුවෙනි. මීන් පෙරද සිරස්තල යෙදීම පිළිබඳව ප්‍රශ්න කෙරුණු අවස්ථාවන්හිදී එම සාකච්ඡාවන්ගෙන් මතු කෙරුණු කාරණයක් වූයේ, බොහෝ විට පුවත් වාර්තාවන් සඳහා සිරස්තල යොදනු ලබන්නේ පුවත් වාර්තාව ලියූ මාධ්‍යවේදියා නොවන බවයි.

යම් පුද්ගලයෙකු කොවිඩ්-19 රෝගියෙකු වීම කිසිසේත්ම එම පුද්ගලයාගේ වරදක් නොවේ. මෙසේ බලන විට "කොවිඩ් සිසුවා" වැනි යෙදුමකින් පුද්ගලයින්ව හැඳින්වීම කෙතරම් සදාචාර සම්පන්න වන්නේද? මේ පිළිබඳව ඔබේ අදහස කුමක්ද?
#MediaEthicsSL #lka #SinhalaPress #Aruna